# සාරාංශය

නිපුණතා පාදක අධ්‍යාපනය ඉතිහාසය විෂය තුළින් ක්‍රියාත්මක වන ආකාරය විමසීමේ අරමුණින් 10 ශ්‍රේණියේ ඉතිහාසය විෂයමාලාවට අදාළව මෙම පර්යේෂණය ක්‍රියාත්මක කෙරිණි. ශිෂ්‍යයෙකුගේ අනිවාර්ය අධ්‍යාපන වයස වූ අවුරුදු 14 සම්පූර්ණකර තිබීමත් අ. පො. ස. සා/පෙළ සඳහා පෙර සූදානම් කාලවකවානුව 10 ශ්‍රේණිය වීමත් මත, විෂයමාලාවේ ක්‍රියාත්මක මට්ටමට සම්බන්ධ විවිධ භූමිකා තුළින් හා සිසුන් එම නිපුණතා සාධනය කරගැනීම යනාදි කරුණු කවර ආකාරයකට සිදුවන්නේදැයි හඳුනාගැනීමේ අරමුණින් මෙම අධ්‍යයනය දියත් කරන ලදි.

අතීතයේ සිට 2008 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වාදෙනු ලැබූ කාලය දක්වා නිපුණතා අධ්‍යාපනයේ සිදුකරනු ලද වෙනස්කම් හා විකාශනය තුළින් ඉතිහාසය විෂය නිපුණතා පාදක ප්‍රවේශයක් කරා යොමුවී ඇති ආකාරය අධ්‍යයනය කිරීමේ අරමුණින් පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය මෙහෙයවනු ලැබිණි. මීට අමතරව පොදු නිපුණතා, නිපුණතා සහ නිපුණතා පාදක අධ්‍යාපනය පිළිබඳ විවිධ දාර්ශනික පර්යේෂණාත්මක හා වාර්තාමය අර්ථනිරූපණ ඔස්සේ කරුණු අධ්‍යයනය කළ අතර, නිපුණතා අධ්‍යයන ඉතිහාසය විෂය හා සම්බන්ධ වන ස්වරූපය හා එහි ක්‍රියාත්මක තත්ත්වය පිළිබඳව හඳුනාගැනීම ද පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය මගින් සිදුකෙරිණි.

පර්යේෂණය සඳහා විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය මෙන්ම ඓතිහාසික පර්යේෂණ ප්‍රවේශය යොදාගත් අතර නියැදි සමීක්ෂණ ක්‍රමවේදය ඇසුරින් අධ්‍යයනයට අවශ්‍ය දත්ත ලබාගන්නා ලදි. මෙහිදී ඉතිහාසය විෂය හා සම්බන්ධ ගුරු උපදේශකවරු නියැදිය, ගුරු නියැදිය 23 ක්, ශිෂ්‍ය නියැදිය 230 ක් සහ විදුහල්පති නියැදියි 12 ක්ද යොදාගත් අතර පන්ති කාමර නිරීක්ෂණ 12 ක් මගින්ද දත්ත රැස්කෙරිණි. දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා ෂෙඩ්‍යුල සහ නිරීක්ෂණ පත්‍රිකා යොදාගැනිණි.

අධ්‍යයනයට සම්බන්ධ කරගත් සමස්ත නියැදියම නිපුණතා අධ්‍යාපනය පිළිබඳ යහපත් ආකල්පවලින් යුක්ත වුවද, එහි ක්‍රියාත්මක මට්ටමේදී සතුටුදායක බවක් දැකිය නොහැකිය. විශේෂයෙන් ශිෂ්‍යයන්ගේ අවබෝධ මට්ටම් හඳුනාගෙන ඒ අනුව නිපුණතා ලබාදීමට දක්වන නැඹුරුව ප්‍රමාණවත් නොවන තරම් වේ. නිපුණතා පාදක අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමුඛතම අභිමතාර්ථය වන්නේ විවිධ කුසලතාවලින් පරිපූර්ණ වූ පුද්ගලයින් බිහිකිරීමට අවශ්‍ය පදනම සැකසීමයි. ඒ සඳහා ඉතිහාසය විෂයමාලාව ප්‍රායෝගික අංශයට යොමුකිරීමෙන්, එම අත්දැකීම් ශිෂ්‍යයාගේ අනාගත ජීවිතයට උදව් කරගත හැකි ආකාරය වටහාදීමෙන්, ශිෂ්‍ය පෞරුෂය ගොඩනගා ගතහැකි වනු ඇත.

ගුරු උපදේශකවරුන් පවත්වනනු ලැබූ සැසි මගින් නිපුණතා පිළිබඳ ප්‍රශස්ත අන්දමේ අවබෝධයක් ගුරුවරුන් ලබාතිබුණද ගුරුවරුන් සතු නිපුණතා පිළිබඳ අවබෝධයත්, ඉතිහාසය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නිපුණතා පාදකව සිදුකිරීමත් අතර ඌනතා පවතී. ගුරුවරුන් පුහුණුකිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් යොදා නොගැනීමත්, මනා සැලසුමකින් තොරව එම සැසි පැවැත්වීමත්, සුපුරුදු රටාවෙන් මිදී නව ඉගැන්වීම් ක්‍රම අනුගමනයට ගුරුවරුන් මැලිකමක් දැක්වීමත් ඊට හේතු වී ඇතිබව පැහැදිලිය.

කෙසේ වෙතත් සමස්තයක් ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ මානව හා භෞතික සම්පත්වල උපරිම සඵලත්වය නිපුණතා ඉලක්ක කොට යොදානොගන්නා බවත්, සම්පත් බෙදියාමේ විෂමතා පවතින බවත් පැහැදිලි වේ. මේනිසා නව විෂයමාලා ප්‍රවේශයක් පද්ධතියට හඳුන්වාදීමට පෙර එහි යෝග්‍යය අයෝග්‍ය භාවය පරීක්ෂාකිරීම සඳහා පූර්ව පරීක්ෂණ පැවැත්විය යුතු අතර මෙහිදී ගුරුවරුන්ගේ සහභාගිත්වය ලබාගැනීම අනිවාර්යයෙන් කළයුතුය. නිපුණතා පාදක අධ්‍යාපනය පාසල්වල නිවැරදිව හා කාර්යක්ෂම තත්ත්වයෙන් සිදු කෙරෙන්නේදැයි පරීක්ෂා කිරීමට සුදුසු නියාමන වැඩ පිළිවෙලක්ද ක්‍රියාත්මක කළයුතුය.

ගුරු වෘත්තිය සංවර්ධනයට අදාළව හෝ විශේෂයෙන් අධ්‍යාපනික ක්ෂේත්‍රයේ නව සංකල්ප පිළිබඳව හඳුන්වාදීමේදී, ගුරුවරුන් පුහුණුකිරීමට වැඩිකාලයක් යොදාගතයුතු අතර පවත්නා සැසි නිසි පරිදි සැලසුම් කළ ඒවා වියයුතුය. එමෙන්ම නව අධ්‍යාපන සංකල්ප හඳුන්වාදීමේදී ඊට සම්බන්ධවන සියලුම අංශවලට නිවැරදි උපදෙස් සහ මගපෙන්වීමක් ලබාදීම කාලෝචිතය. ඒ සඳහා ගුරු උපදේශකවරුන්ට අමතරව ගුරු මධ්‍යස්ථානවල සේවාවද ලබාගැනීම කළහැකිය. එමගින් විෂයේ ඇති සුවිශේෂී බව, නිපුණතා පාදක අධ්‍යාපනයේ වැදගත්කම හා අවශ්‍යතාව පිළිබඳ අදාළ සියලු පාර්ශව දැනුවත්වීමෙන් වඩා ඵලදායී ප්‍රතිඵල අනාගතයට උරුම වනු ඇත.

# ABSTRACT

This research was conducted with the intention of studying how the competency based education is implemented through the syllsbus of History in Grade 10, taking into consideration the facts that a student being reached to his or her compulsory education at the age of fourteen years, the grade 10 being the year prior to the ordinary level examination and how the students achieve the levels of competencies through the different roles implemented in the curriculum content.

This literature of research was focused towards studing how the subject History has gained a competency based approach through the changes and its cast up to the educational reforms in 2008 beginning from the ancient history. In addition to it, studies were conducted taking philosophical ideas, research based opinions and recorded definitions into consideration. Not only that but also the nature of the relationship between competency based education and the subject History was considered based on the studies of Literary Researches.

For these researches descriptive research approach was considered and data was collected through a sample survey method. The sample consisted of 23 teachers of History, 230 students and 12 principals. Additionally data was collected through the observation of 12 classrooms. Questionnaire, interviews, schedules and observation sheets were used for the collection of data.

Eventhough the samples that were used for the study had positive attitudes towards the competency based sducation, when practicing it, it is bit far from satisfactory. Specially, deciding on the competency according to the level of the knowledge of the students is not sufficient. The final outcome of a competency based education is to make a person who is skilled in various ways. For that it can be fulfilled if the student is exposed to the practical side of history curriculum, and by making him aware about the importance of it and as a result the personality can be enhanced in him.

Eventhough teachers of History have gained a vast knowledge about competencies through seminars conducted by in-service advisors, there are short-comings in teaching the subject according to the competency. The insufficiency of time allocated to train the teachers, the unsatisfactory organizing of seminars, and teachers' negative attitudes towards changing their old methodology can be shown as causes for it.

As a whole, it is clear that the human and physical resources connected to the teaching learning process do not implement aiming at the maximum success. There are inequalities in distributing the resources. Hence, before introducing a new curriculum to the system it is very important to find whether it is applicable to the system. This can be done through tests done prior to it, with the help of teachers. And also it is needed to implement a method to find out whether the competency based education is in practice in schools efficiently.

In addition to that when introducing a new methodology in the field of education, it is important to train the teachers taking a considerable period of time. And also the sessions conducted should be well organized. And also when a new concept is introduced it is very important to give accurate instruction and guidance to all the personnel connected to it. For that the service of in-service advisors and teacher centres can be taken. Through that the speciality of the subject, the importance of competency based education and the need for that can be implanted in all the parties responsible and it will bring more successful results in future.